# සුභාෂිතයෙන්.....

| | |
|---|---|
| සතතින් පවන් අඹ කොල බුදින | තවසර |
| දැහැමින් මිදේ දුට ලෙල දෙන | ලියතඹර |
| බුදිමින් යමකු කිරි තෙල් දී ඈ | අහර |
| ඉඳුරන් දමත සිඳු ඉපිලේවි | මඳර ගිර |

## ගැදි පැදිය

සතතින්
පවන් අඹ කොල බුදින
තවසර
ලෙල දෙන ලිය තඹර දුට
දැහැතින් මිදේ
යමකු
කිරි තෙල් දී ඈ
අහර බුදිමින්
ඉඳුරන් දමත
මඳරගිර
සිඳු ඉපිලේවි

**පැහැදුම ඃ-**

සතතින් - නිතරම; පවන් අඹ කොල බුදින - වාතයත් ජලයත් කොල වර්ගත් කන (වලඳන); තවසර - තාපසයා; ලෙලදෙන - ලෙල දෙන්නා වූ; ලියතඹර - නාරිලතා පුල් නම් මල් (නාරිලතා පුස්ප ?); දුට - දැක්කොත්; දැහැතින් මිදේ - ද්‍යානය බිඳේ (කැඩේ); (ඒ මල් දැක්කොත් යතිවරයාන්ගේ සිල් බිඳෙද්දැයි නොදනිමි) යමකු - යම් කෙනකු; කිරි තෙල් දී ඈ - (එල) කිරි, (එල) ගිතෙල් , දී (කිරි) ආදී; අහර බුදිමින් - ආහාර (ගනිමින්) කමින්; ඉඳුරන් දමත - ඉඳුරන් දමනය කලොත්; (එය හරියට) මඳර ගිර - මන්දර පර්වතය; සිඳු ඉපිල එවි - මුදේ පා වෙන්නා වගේය.

**විසිතුර ඃ-**

වාතය නම් බිඳිය (කෑ) හැකි දෙයක් නොවේ. ජීවත්වීම සඳහා වාතය ස්වාස කිරීමත් (සුවැසීමත්), ජලය පානය කිරීමත් (බීමත්) ආහාර භක්ශනය කිරීමත් (බිඳීමත්) හැම සත්වයකුටම (ශාකයකටම ?) උවමනාය. තවසරයනුත් සා එලු බටලු ආදී සතුන් මෙන්ම කොල ජාතිත් දාන්‍ය (දැහැති) ජාතිත් බෙරි (කුඩා ගෙඩි - ගෙඩිති) ජාතිත් ආහාරයට ගනිත්ල. තවසරුන් පමනක් නොව සතුනුත් වැල වරකා, ගස්ලබු (පෝපෝ) කෙසෙල් වැනි පළතුරු ආහාරයට ගන්නා බව අපි දනිමු. මෙහි 'කොල' කන බව කියා ඇතත් අළපල මල් ද එයට එකතු කර ගැනිම නිවරද යැයි සිතමි.

ලියතඹුරු/ ලියතඹරා මල් මා දැක නැත. නාරිලතා මල් ද දැක නැත. එහෙයින් ඒ ගැන යමක් කියන්නට මම නොදනිමි.

සල්මල් දුටු විට ද සමහරුන්ට අඹුන් සිහි වෙතැයි කියති. ලියතඹුරුත් එබඳු මලක් දැයි නොදනිමි. 'ලිය' යන වචනය නිසා එය වැල් ජාතියක් යයි සිතමි. වැල්දෙඩමි, ගස්ලබු යන වියහර ගැන සිතන්න. කෙසේ වෙතත් 'සල්මල්' නිසා තවිසන් ගේ දැහැන් බිඳෙන බවක් මා අසා නැත. (එල) කිරි (ගි) තෙල් දී (කිරි) රාගය ඇවිස්සෙන - රාගය තද වන ආහාර බව කියති. (එහෙයින් අනගාරිකයන්ට වෙහෙසින් ම ඒ ආහාර අගුනය) "ලාට තෙලේ වැඩි වෙලා" යනුවෙන් කියන්නේ ඒ අදහසය. (මඳන වියේ - ඒ අදහසම දෙයි) තෙලේ වැඩි වන - තෙල් මෝරන ආහාර බුදිමින් ඉඳුරන් දමනය කල (දැමිය) නොහැක. ඒවා කමින් ඉඳුරන් දමනය කරන්නට සිහිම මඳරගිර මුදේ පාවිම වැනි අපුරු සිද්දියකි.

විස්නු මඳරගිර මන්දන්ඩ (මන්ථ දණ්ඩ - කලම්බන දන්ඩ (හොඳ්ද හැඳි ගෑම වැනි ) ලෙස ගෙන කිරිමුහුද කැලැම්බු බව කියති. මඳර/මඳාරා යනු එරබඳු/ එරමුදු ගසයි/ තවසර දැහැතින් මිදේ ඒක වචන ලෙස සැලකීමටත්, ලෝ සත රැකෙති/ බිඟු.... නඳ දෙති/ සත නොගහිති බහු වචන වීමටත් හේතුව මම නොදනිමි.

# ජී බී ගේ නිශ්ශබ්දතාවය හා
# නිසැඳැස් පද්‍ය



**වි ක ධර්මබන්ධු**

ජී බී සේනානායක සූරින් විසින් ගද්‍ය හා පද්‍ය අතර වන නිර්මාන ලෙස හඳුන්වමින් 'පලිගැනිම' නම් වූ කෙටි කතා සංග්‍රහයට ඇතුලත් කරන ලද නිර්මාන 'නිසැඳැස් කාව්‍ය' සම්ප්‍රදයේ ආරම්භය ලෙස සැලකෙන බව (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ප්‍රකාශයට පත්කල) 'නූතන පද්‍ය සංග්‍රහයේ ' සඳහන් වේ.

ගද්‍ය හා පද්‍ය අතර වන නිර්මාන ලෙස හඳුන්වන මේ පබඳ වෙසෙස 'ගැදි පැදි' ලෙසින් හැඳින්වීම ඉතා සුදුසු බව මට දැන් හැඟේ. කලින් මා ලියූ ලිපියක 'දෙළඳ කොස් ලාරුමියා' ආදී වචන හැදි ඇති විදියට ඒ නමඳ හඳ ගත හැකි බව කියා ඇත. සාය සහ හැට්ටය ඇඳුම් දෙකකි. සායත් හැට්ටයත් එකතු කොට හඳගත් ඇඳුමක් සේ පෙනෙන 'ගවොම' එක් ඇඳුමකි.

මහගමසේකර සූරින්ගේ 'දුකට කියන කවි සීපද' අතරින් තෝරා ගත් මේ සීපද තුන ඔබේ කනට හොඳ පුරුදුය.

පිලේ පැදුර හේනට අරගෙන — එනවා
එලා පැදුර මැස්සේ එහි — සැතපෙනවා
රටා වියපු අත් දෙක මට — සිහිවෙනවා
හිතේ දුකට එතකොට කවි — කියවෙනවා

ඉර පායා ඉර අවරට — ගියාලෝ
සඳ පායා සඳ අවරට — ගියලෝ
හැඩු කඳුලු මුදුට එක් — උනාලෝ
ලමා ලපටි නඳනා කොයි — ගියාලෝ

නුඹේ කරට මල් මාලා — ගොතන්නට
මඳුමල් පිපෙනෙවා හේනේ වැට — දිගට
නුඹේ කටින් ගී සීපද — අහන්නට
තවමත් ගිරවි එනවා පෙර — පුරුද්දට

අමරෙදේව සූරින් මේ සීපද තුන ගීතයක් ලෙස ගයන විට කොතරම් මිහිරිද ? ඒ සීපද තුනින් අන්තිම සීපදය ගීතයක් / සින්දුවක් ලෙස ගැයෙන හැටියටත් ගැදි පැදියක් ලෙස ලියන හැටියටත් මා මෙසේ ලියන්නේ මගේ දැනුමට අනුවය.

"නුඹේ - කරට
මල් මා - ලා
ගොතන්නට
මඳු මල් පිපෙන - වා
හේ - නේ - වැට දිගට
නුඹේ කටින්
ගී - සී - පද අහන්නට
තවමත්
ගිරවි එන - වා
පෙර පුරුද් - දට "

මා මෙය ලිවේ කවියේත් / ගීයේත්, සින්දුවේත් / ගීතයෙත් ගැදි පැදියේත් බැඳිම හෙවත් නෑකම දැක්වීමටයි.

ජී බී සේනානායක සූරින් 'පලි ගැනිම' නම් කෙටි කතා සංග්‍රහයේ ලියා ඇති 'නිශ්ශබ්දතාවය' නම් ප්‍රබන්ධය ගැන මම මගේ අදහස් මෙසේ පල කරමි.

අද මලවුන් අතර සිටි ජී බී ට මගේ මේ ලියවිල්ල කියවා එයට උත්තර දීමට හැකියාවක් නැති බව මම දනිමි. ඔවින් අද සිටිත් නම් ඔවින් මට දෙන උත්තරය කෙබඳු එකක් විය හැකි දැයි කියන්නටත් මම නොදනිමි. මේ ඒ 'නිශ්ශබ්දතාව' නූතන පද්‍ය සංග්‍රහයේ දැක්වෙන සැටියි. න/ණ , ල/ළ පමනක් වෙනස් කොට ඇත

"දෑත බිම ඔබා
පස්සට වාරු වී
නිසල ව හුන්
ඇගේ ලිහිල්
කෙස් රොදක්
නිහඬ ව හමන
සුලඟින්
එසවී
මා මුහුනෙහි
හැපෙත් ම
ඇගේ රන්වන්
මුහුන දෙස
බැලූ මම
ඇසීමට දිගු කලක්
පුල පුලා සිටි
කිසිවක් ඇසීමට
සිතිමි"

★ ★ ★

මසකු හඬ නගා දැඟලූයෙන්
ගං ඉවිර දෙස
පන් ගසීන් යුත්
නො ගැඹුරු බොර දිය
කැලඹීන.
ඈත ඉවිරෙහි
උසට වැඩුනු
මහ උන පඳුරින්
අහසට නැගුණු
කොබෙය්යෙක්
කෑ ගසා ගෙන
පියඹා ගියේ ය

★ ★ ★

ඉක්බිතිව මහා නිශ්ශබද්තාවයක් පැතිරින.

★ ★ ★

ඇගේ රන්වන් දිගටි මුහුන දෙස
බැලූ මම
ඇසීමට දිගු කලක් පුල පුලා සිටි
කිසිවක් ඇසීමට
යලිත් සිතිමි

★ ★ ★

නිශ්ශබ්දතාවය දැඩිවිය
පෙදෙස වසා ගෙන පැතුරුනු
නිහඬ බැවින් මිරිකුනු මම
ඇයගේ
රන්වන්
නිසල
මුහුන දෙස බලා
කරබා ගතිමි.

මේ ප්‍රබන්ධයේ එක් තැනක, ඇති 'නිශ්ශබ්දතාව' තවත් දෙපෙලක 'නිශ්ශබ්තාවය' වූයේ කාගේ වරදින් දැයි නොදනිමි. මා දන්නා තරමින් නිහඬව හමන සුලං නැත. මඳ නල / මඳ මරු උවත් හමන විට යන්තමින් හෝ හඬක් ඇසේ.

එලුවන්, ලාරන්, මීයන් ආදි සතුන් හඬනගා දැඟලීම සිරිතයි. කබරු නයි පිඹිති. මසුන් හඬ නගා දැඟලන බවක් මම නොදනිමි. ලලුන්, කාවය්යන් දැඟලන හඬ නම් මා ඇසා ඇත. මොවුන් කියන්නට අදහස කලේ දැඟලන හඬ ය. එහෙත් කියවී ඇත්තේ 'හඬ නගා දැඟලීමක්' ගැන ය. මීයකු උවත් දැඟලන හඬ එකකි; හඬ නගා දැඟලීම ඉන් අනෙකකි.

වැරදිමකින් ඇගේ හිස ඔහුගේ මුහුනෙහි හැපීමේ අරුමයක් නැතත් කෙසේ රොදක් මුහුනෙහි හැපීම නම් අරුමයකි. කෙස් රොදක් මුහුනෙහි ගැටීම හෝ ඇතිල්ලීම නම් අරුමයක් නොවන සිදුවීමකි.

ඇගේ කෙස් රොද ඔහුගේ මුහුනෙහි ගෑවුනේ ඔවින් එකිනෙකාට ගෑවෙන නොගෑවෙන තරමට ලංවී හිඳ ගෙන සිටි නිසා ය. මසාත් කොබෙය්යාත් නිසා කලක් තිස්සේ අසන්නට පුල පුලා සිටි කාරනය ද ඔහුට අමතක විය. ගුවන් යහනක් ගියත් එබඳු අවස්තාවක අපට නම් එසේ සිදු නොවේ. නිහැඩියාවෙන් පසු ඔහුට යලිත් ඒ සිතිවිල්ල පහල විය.

මුල් වතාවේ නුදුටු වෙනසක් දෙවන වතාවේ ඔහු දුටුවේය. එවිට ඇයගේ මුහුන දිගටි වී තිබිනි.

'ඔයා මට ආදරේද ? මං ඔයාට ආදරෙයි' කියාගත නොහැකි මේ ලෙඩුන් දෙදෙනා ගැන අනුකම්පා කල යුතු ය. නිවිඩු සෙල්මුවා ඉතිරි රුවක් අතපත ගා සෑහීමකට පත් වන එකතු සේ ඔහු හිත හදු ගත්තේ ය. මෙබඳු සිදුවීම් ගැන කියා හිත සැහැල්ලු කර ගත යහලුවකුට මේ කතාව කිව්හොත් ඔහු කට කොහකින් සිනාසී 'බොට..... තියනවාදැයි' අසනු ඇත.

"මගේ අතපය වාරු නෑ බොලං" යනුවෙන් අපේ සීයා කියන්නේ 'අත පය හයි හත්තිය' නැති බවය. මෙතන 'වාරු' යොදු ඇත්තේ පිටි පස්සට 'බර දි' යන තේරුම දීම සඳහාය.

පී බී මේ නිර්මානයේ පද (ජේලි) ලියා ඇත්තේ චන්දයක් ගැන නොසිතා ගිතුවක්කාර විදියටය. " සුලඟින් - එසවී - ඇගේ රන්වන් දිගටි මුහුන දෙස" යන (ජේලි) පද තුන දකින විට එසේ සිතීම පුදුමයක් නොවේ. මේ නිර්මානයට පසු බිම් වී ඇත්තේ ඔවින් මුහුණ පෑ - ඔවින්ට සිදු වූ සැබෑ සිද්දියක් දැ' ය් යමෙකුට සිතෙන්නට බැරි නැත. -දිගු කාලයක් තිස්සේ " මෙ බඳු සිදුවීම් කොතෙක් නම් සිදු වන්නට ඇද්ද?

තරුනියක් සහ තරුනයකු නිදහසේ පාලු ගං ඉවුරකට යන්නෙත් එකිනෙකාගේ ඇගේ ඇතිල්ලෙමින් නිඳ ගන්නේත් ඔවිනොවින් කෙරෙහි ඇති ආදරයත් විශ්වාසයත් නිසා ය. ඒ අදියරට එන්නේ එකාට එකා තම අදහස් එළිදරව් කිරීමෙන් පසු ය. එකිනෙකාගේ අදහස් නුවමරු වී එකඟතාවයකට පත් වීමෙන් පසු ය.

තිරිසන් සතුන් විවිද ඉරියව්වෙන් තම සිතැඟි පල කරති; උනුන් සිති අදඳ බැඳ ගනිති; එක් වෙති; පැටවින් හදති; මව් පියන්ගේ නය ගෙවති. (ඊලඟ පරපුර හැදිම මව් පියන්ගේ නය ගෙවීමකි.)

මිනිසා බැල්මෙන් ඉරියව්වෙන් හැසිරීමෙන් මෙන්ම කතා බහින් අනෙකාගේ සිත් අදඳ බැඳ ගනිති; අතිනත අල්ලා ගෙන යති; සිප වැළඳ ගනිති; පෙම්පත් - තෑගි බෝග හුවමාරු කර ගනිති; බැඳෙති; දරුවන් හදති; මව් පියන්ගේ නය ගෙවති; ලෝ දහම එයයි.

තරුනයන් ඇසුරු කොට තම යෞවන නසා ගත් තරුනය අන් තරුනයකු ඉදිරියේ ගොලු වීම, අසරන වීම, බොරු සිල් දැක්වීම දහමයි; සොබාවයි.

විකල ලිඟු පිහිටීම, ද්වප් බංග වීම හෙවත් ලිඟු බල සුන්වීම, ලිඟු රෝග හදු ගැනීම නිසා තරුනයා තරුනිය ඉදිරියේ ගොලු වීම, තරුනයන් මග හැරීම, ගිහි කමට ගැරහීම දහමයි; සොබවයි.

මානසික හේතු නිසා ද ගැනු පිරිමි ඔවිනොවින් ඉදිරියේ ආදර රැඟුම් - අගර දඟර නොදක්වති.

මෙයින් කවර හේතුවක් මොවින් දෙදෙනාට බල පෑවා ද යන්න අපි නොදනිමු.

මේ ලිපිය ගැන වාද-විවාද කිරීමක් ගැන මගේ අදහසක් නැතත්, යම් කෙනෙකුට තම අදහස් ද දැක්විය හැකිය. එ විට මගේ අදහස් පහඳ දිය හැකිය.

වි.ක. ධර්මබන්ධු

**සන්නස**

මංගල යෝජනා
දැන්වීම්
ප්‍රතිඵලදායකයි